**මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු** : **නේවාසික ව්‍යාපාර කළමනාකාර**

**සේවා ගණය** : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1 සේවා ගණය)

**වැටුප් පරිමාණය** : රු. 81,670-15x2,270 = 115,720/-

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සමග

කළමනාකරණ / කෘෂිකර්ම / සැලසුම් / සංවර්ධන / සමාජීය විද්‍යා / තාක්ෂණ / ජල කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම / තනතුරුට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන / වාරිමාර්ග / ජල කළමනාකරණ / කෘෂිකර්ම / ඉඩම් / සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් පරිපාලන / වාරිමාර්ග / ජල කළමනාකරණ / කෘෂිකර්ම / ඉඩම් / සංවර්ධන හා ආයතන සංවර්ධන ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

---

**තනතුර** : **භෞතික සැලසුම්කරු (II වන ශ්‍රේණිය)**

**සේවා ගණය** : කනිෂ්ඨ කළමනාකාර (JM 1-1 සේවා ගණය)

**වැටුප් පරිමාණය** : රු. 42,600-10x755-18x1,135 = 70,580/-

**සුදුසුකම් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නගර හා ග්‍රාම නිර්මාණය / දේපළ කළමනාකරණය විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.
02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම.

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරග විභාගයක් හා / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

තමා විසින් සකස් කර ගත් ජීවදත්ත පත්‍රිකාවක් 2021.03.19 වන දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුව ඇත.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි. අයදුම්පත සමග අධ්‍යාපන / වෘත්තීය සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, එම සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම කටයුතු සම්බන්ධව අවසන් තීරණය ගැනීම අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බවද දන්වමි.

**සැ. යු :** අයදුම්පත් භාර ගන්නා අවසන් වන දිනය වන විට තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු බව කාරුණිකව සලකන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.**

Source: Dinamina, Daily News (2021.03.05)